39. එම. පි. 182.
40. එම. පි. 197.
41. සුරවීර ඒ. වී., 2001 මුද්‍රණය, නොයන් පුතුනි ගම හැරදා, කුරුලු පොත් ප්‍රකාශන, රාජගිරිය, පි. 68-69.
42. එම. පි. 98.
43. ශ්‍රී ලංකාවේ දේශීය කෘෂිකර්මය, ශ්‍රී ලංකාවේ හරිත විප්ලවය, පි. 76-104 හා 1972 සහ 1975 ඉඩම් ප්‍රතිසංස්කරණ, පි. 104-117.
44. එම. පි. 99-100.
45. එම. පි. 181-182.
46. නන්දිමිත්‍ර ඇරැව්වල, 1994 (දෙවැනි මුද්‍රණය) මිහිසරණ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ. පි. 150.
47. එම. පි. 168.

# මධ්‍යකාලීන සිංහල ක්‍රියාපදය පිළිබඳ බුත්සරණින් හෙළි වන තොරතුරු


වින්ධ්‍යා වීරවර්ධන

Ancient written records are the main sources of a historical linguistic study .There are two fold varieties of written records regarding ancient Sinhalese language, namely inscriptions and literary texts. In historical linguistics, Sinhalese language is classified into four periods due to structural variations. They are Sinhalese Prakrit era, Old Sinhalese era, Middle Sinhalese era and Modern Sinhalese era. Buthsarana, written by Vidya Chakravarthi is one of the significant literary texts belonging to middle Sinhalese era. Diachronically an investigation on Sinhalese verb will help to identify the gradual development of the Sinhalese verb system as well synchronically; special characteristics of the verb in middle Sinhalese era can also be found out. Therefore this study has value both from a historical linguistics and structural linguistics perspective. Finite verbs and nonfinite verbs, tenses, optative mood, causal verb, imperative mood, conditional mood, past participle, progressive form, verbal nouns, inflectional and derivational suffixes are among the special features that are discussed here.

ක්‍රියා පදය යනු වාක්‍යයක කේන්ද්‍රීය පදයයි. භාෂා අවධි ගත කිරීමේ දී මධ්‍යකාලීන සිංහල යුගය සේ ගැනෙන්නේ ක්‍රි. ව. 8 සිට ක්‍රි. ව. 13 දක්වා යුගයයි. බුත්සරණ ග්‍රන්ථය ලියැවී ඇත්තේ ද මේ අවධියේ දී ය. එහි කතුවරයා ලෙස සැලකෙන්නේ විද්‍යාචක්‍රවර්තීන් ය. බුත්සරණ ග්‍රන්ථය අධ්‍යයනයෙන් මධ්‍යකාලීන සිංහල යුගයේ ක්‍රියා පදය පිළිබඳ ව අනාවර්ණිත කරුණු සාකච්ඡා කිරීම මේ ලිපියෙහි අරමුණයි.

© කථිකාචාර්ය වින්ධ්‍යා වීරවර්ධන
සංස්. මහාචාර්ය පැට්‍රික් රත්නායක, ආචාර්ය කේ. බී. ජයවර්ධන, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දිනලි ප්‍රනාන්දු
මානවශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, 22 කලාපය, 2014/2015
මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

කිසියම් ව්‍යාකරණ රීතියක් පැරැණි ග්‍රන්ථ කර්තෘවරුන් කිහිප දෙනකු ම භාවිත කර ඇත්නම් එය එකල ව්‍යවහාර වූ භාෂා රීතිය ලෙස ඓතිහාසික වාග්වේදීහු පිළිගනිති. ඒ අනුව මෙහි දී ක්‍රියා පද සම්බන්ධයෙන් බුත්සරණෙහි භාවිත රීතිය හඳුනාගෙන ඒ ඇසුරින් මධ්‍යකාලීන සිංහල ක්‍රියා පද හඳුනාගැනේ. එහි දී පහත දැක්වෙන ක්‍රමවේදය අනුගමනය කෙරේ. එනම් ක්‍රියා පද සමාපක හා අසමාපක ක්‍රියා ලෙස මූලික වශයෙන් වර්ගීකරණය කොට ඒ එක් එක් ක්‍රියා ප්‍රවර්ග සම්බන්ධයෙන් හඳුනාගත් ප්‍රත්‍ය අනුබද්ධය හා දත්ත සංහිතාව විශ්ලේෂණයට ලක් කෙරේ.





1. ත්‍රෛකාලික ක්‍රියා
2. විධි ක්‍රියා
3. ආශිර්වාද ක්‍රියා
4. ප්‍රයෝජ්‍ය ක්‍රියා

1. පූර්ව ක්‍රියා
2. මිශ්‍ර ක්‍රියා
3. අසම්භාව්‍ය ක්‍රියා
4. කෘදන්ත

## සමාපක ක්‍රියා

### 1. ත්‍රෛකාලික ක්‍රියා




බුත්සරණ ග්‍රන්ථයේ අනතීත කාල ක්‍රියා වරනැඟීමේ දී (වර්තමාන සහ අනාගත යන කාල ද්වයය ම සඳහා) එක ම ප්‍රත්‍ය අනුබන්ධයක් දැකිය හැකි වෙයි.



### අනතීත කාල ප්‍රත්‍යය අනුබන්ධය

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| උත්තම පුරුෂ | ම්, මි | ම්හ, මො, මහ |
| මධ්‍යම පුරුෂ | හි | හු (යු, වු) |
| ප්‍රාණවාචී | යි | ති/ත් |
| ප්‍රථම පුරුෂ | | |
| අප්‍රාණවාචී | ඊ | හු |
| | | හ |
| | | හැ |

### අනතීත කාල ක්‍රියා බුත්සරණෙහි යෙදෙන අයුරු

**උත්තම පුරුෂ**

**ඒකවචන** ම් - ක්‍රියා යෝග නිපාතයකට පූර්වයෙන්
‘භාග්‍ය ඇත්තෙම් නම් මම් මැයැ’
‘මඬුවන් හට අවවාද කළ පරිදි කියම්’’
මි - ‘මම මෙතැනැ සිටියෙමි/මම අනෙකෙකිම් නොවෙමි’

**බහුවචන** ම්හ - ‘‘(ඇපි) දිවි පමණින් ගැත්තම්හ.’’
මො - ‘‘කන් ලද්දමො නම් ඇපියැ.’’
‘‘ඇපිත් අප ශක්තියක් කරන්නමො වේ ද’’
මහ - ‘‘හික්මවා ගැන්ම ස්වාමීන්ට පිළිවන් බව දන්මහ’’

**උත්තම පුරුෂ**

**ඒකවචන**

මු - ‘‘මම අනෙකෙකුම් නොවෙමි... ස්වාමි දරුවාණන් ගෙ ශාසනයෙහි මහණවූවන් කෙරෙන් පිටත් - එක්තරා මිඩියක් මු යි කියමි.’’

**මධ්‍යම පුරුෂ**

**ඒකවචන**

හි - ‘‘මෙ ආළවකයාගෙ විමාන යැයි තො උඹට නොකියෙහි ද?’’

**බහුවචන**

ව/ වු - ‘‘තොප වළැ සිටියැවු’’
‘‘තොප කපා ගනු ව’’

**ප්‍රථම පුරුෂ**

**ඒකවචනː**

යි - ප්‍රාණවාචීː- ''බමුණු හය ඇතිවැ මෙසේ කියා හඬයි''

අප්‍රාණවාචීː- ''එක් වාතයෙක් සත් රුවන්වැලි තනයි.''

ඊ - ධාත්වන්ත යි ස්වරය දීර්ඝ වීම

''සහම්පතී මහා බ්‍රහ්මයා සරස් මෙහෙතැන්හි කුමට සිටීද?''

**බහුවචනː**

ත් ''බුදුන් එසේ වදාරත් මැ මාර තෙමෙ බුද තේජසින් කකියා ගොස් අන්තඃපුරයෙහි ඇත්තවුන් බලත්''

ති ''මොවුන් කී බසැ නොපැකිලෙති''

''පස්වග මහණහු බරණැස ඉසිපතන විහාරයෙහි වෙසෙති.''

හු ''බිසවු කල්‍යාමෙකින් සීසන්න ලදිත් කියන්නා හු''

''එසඳැ බෝධිසත්වයෝ කියන්නාහු''

''මහා ජනයො ද එ ඍධි ප්‍රාතිහාර්යය බලම්හයි පසුපස්සෙහි යන්නාහු''

උත්තම පුරුෂ සහ ප්‍රථම පුරුෂ ප්‍රත්‍යය සමග යෙදෙන සමීකරණ වාක්‍යයක හ/හැ ප්‍රත්‍ය බහුවචනාර්ථය හැඟවීමට යෙදෙයි.

> ''අතැවැස්සො පාත්‍රය ගන්නා පිණිස මා ආකාශයට නැංග නොදෙන්නාහ''

> ''දෙදෙනා වහන්සේ... අප ලොව රහතුන් නැති බව දන්නෙ අදයැ මෙසේ. කථා කෙරෙමින් යන්නාහැ.''

අතීත වරනැඟීමේ දී සාමාන්‍ය අතීතය හා විශේෂ අතීතය වශයෙන් ද්වවිධ රූප බුත්සරණෙහි හමු වේ. සාමාන්‍ය අතීත වරනැඟීමේ දී ක්‍රියා ශබ්දයත් ප්‍රත්‍යයත් අතරට එ, ඒ, අ, ආ, ඔ, ඕ ස්වර අතුරින් එක් ස්වරයක් කාරක වාචී ප්‍රත්‍ය ලෙස යොදා ඇත. එසේ ම සාමාන්‍ය අතීතයේ දී ප්‍රථම පුරුෂ වර නැඟීම පහත දැක්වෙන පරිදි වේ.



ප්‍රථම පුරුෂ
- අප්‍රාණ වාචී
- පුරුෂ වාචී
- ස්ත්‍රී වාචී

මීට අමතර ව ධාත්වන්ත ස්වර පූර්වීකරණයෙන් කෙටි අතීත ශබ්ද සාධනය සිදු වේ. ඉහත දැක්වූ පරිදි ප්‍රථම පුරුෂයේ, පුරුෂ වාචී අප්‍රාණ වාචී, ස්ත්‍රී වාචී වශයෙන් වන බෙදීම කෙටි අතීතයේ දී දක්නට නොලැබේ.

ක්‍රමික ධාතු ඒවායෙහි අතීත රූප හා වර්තමාන ප්‍රථම පුරුෂ ඒක වචන හා බහු වචන රූප පාදක කරගෙන ධාතු ගණ 6කට බෙදිය හැකි වන අතර විශේෂ ධාතු ගණ අක්‍රමික වරනැඟීම් යටතේ විමසා බැලේ.

සාමාන්‍ය අතීත ශබ්දය බුත්සරණෙහි යෙදෙන්නේ සීමා සහිත ව ය. එහි ප්‍රත්‍යය අනුබන්ධය පහත දැක්වේ.

**සාමාන්‍ය අතීතය**

| | | ඒකවචන | බහුවචන |
|---|---|---|---|
| උත්තම පුරුෂ | | එ + මි | උ + මො/එ + මු |
| | | එ+ මි (බැලුවෙමි) | බැලුමෝ (බැලුවෙමු) |
| මධ්‍යම පුරුෂ | | එ + හි (බැලුවෙහි) | අ + හ/ආ + හු<br>බැලුවහ/බැලුවාහු |
| ප්‍රථම පුරුෂ | අප්‍රාණවාචී | | |
| | පුරුෂවාචී | ඒ + ය | අ + හ/ආ + හු<br>ඕ + ය |
| | ස්ත්‍රී වාචී | ආ + ය | බැලුවහ/බැලුවාහු<br>බැලුවෝය. |

නිදසුන්ː

උත්තම පුරුෂ

බහු/ ''නුඹගෙ මනහර රූ දුටු හෙයින් ඇස් ලද්දමො නම් අපියැ''

ප්‍රථම පුරුෂ - ''ශක්‍රයෝ දස දහසක් විජයුත්තර පිඹීමින්
බහුවචන නික්මුණ රජ්ජුරුවෝ මෙ සා මා ගෙ විජිතයෙහි
එක ද කුමාරයෙක් නැද්ද යි විචාළො''

කෙටි අතීත රූපය බුත්සරණෙහි සුලබ ව හමු වේ. ඒ සඳහා වන ප්‍රත්‍යය අනුබද්ධය පහත දැක්වේ. ධාත්වන්ත ස්වර පූර්වීකරණයෙන් ධාතු ගණ සයෙහි ම කෙටි අතීත ශබ්ද සාධනය සිදු වේ.

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| උත්තම පුරුෂ | | |
| | ඉ/ඊ + මි/මි | උ/ඌ +මෝ, ම්හ |
| | හැඳිනිමි/හැඳිනිමි | |
| | බැලීමි/බැලීමි | බැලුවො |
| මධ්‍යම පුරුෂ | | |
| | ඉ/ඊ හි | උ/ඌ +හැ |
| | බැලීහි | |
| ප්‍රථම පුරුෂ | | |
| | ඊ + යැ | ඌ +හු/හැ |
| | ඊ | බැලූහ |
| | බැලීය | බැලූහැ |
| | බැලී | බැලූහු |

උත්තම පුරුෂ ඒකවචන
''මම විඳි තෙනැත්තවු මෙතැනින් සොයා දිටිමි නම්''
බහුවචන
''ගමැ ඇත්තන් ලවා උසුළු පැවීමි.''

උත්තම පුරුෂ බහුවචන
''ඇපි වූකල්... හද්‍ර සමයක් දෙඅතින් හැරැ මුදුනෙහි තැබූම්හ. බුදු අමා රුකක් ආශ්‍රය කළම්හ''

මධ්‍යම පුරුෂ ඒකවචන
''තො... ගුරුළු වෙසක් මවා - ගෙන තමා නාගරාජයා හට දැක්වීහි.''
බහුවචන
''තෙපි මැ දුට හැ''



ප්‍රථම පුරුෂ ඒකවචන
''රජ... කිපී පොරොවින් තෙල සොරු හිස කප කී ල ආලවකයා නැවත මෙ මහණ වතුරින් යවා පියමී මහ වැස්සක් වැස්සවීයැ.''
බහුවචන
''එහඬ අසා මහතාණො රථය නැවැත් වූහ''
''බුදුහු ... සාධා දෙන්නා හැ''

## 2. විධි ක්‍රියාව

විධානයක් නියෝගයක් හෝ ඉල්ලීමක් ප්‍රකාශ කරන්නේ විධි ක්‍රියා මඟිනි- විධානාර්ථය යෙදෙන්නේ මධ්‍යම පුරුෂයේ ය. විධි ක්‍රියාව නිරූපණය සඳහා බුත්සරණෙහි යෙදී ඇති ප්‍රත්‍යය මෙසේ ය.

| ඒක වචන | බහුවචන |
|---|---|
| -ග | |
| -ව | -වූ |
| -0 | |

### ධාත්වන්ත ස්වරය දීර්ඝ ව යෙදීම

ග - ''බෝධි සත්වයෝ අත අල්ලා නඟා සිටුවා තො නොබා කියග'යි වදාළහ''
ව/වු - ''අද දවස අඹු දරුවනට සමු දී සෙට යන පරිද්දෙන් සිතව'යි කීහ''
- ''තා කට හැකි දෙයක් ඇත්නම් කර ය වදාර වැඩහුන් සේක''
- ''සියලු වාදී සමූහයන් බිඳෙන බව කියවු''
ධාත්වන්ත ස්වර දීර්ඝය - ''තො දෙව්ලොවට මැ නැඟී යා 'යි වදාළ සේක.''

## 3. ආශිර්වාද ක්‍රියාව

වර්තමාන ආශිර්වාද ක්‍රියාව සෑදෙන්නේ වර්තමාන කෘදන්ත රූපයෙහි වරනැඟුණු ක්‍රියා රූපයට වා ප්‍රත්‍යයය එක් වීමෙනි.

බුත්සරණෙහි ආශිර්වාද ප්‍රත්‍යය ලෙස වා සහ ව යෙදී ඇත.
වා - ''මෙ කුමරා දිගා වේවා'යි ය ය තො ද සුවපත් වේවා'යි වදාළ සෙයෙක.''
ව - ''බුදුහු මා රකිත්ව -''
වේවා - ''ආයු බොහෝ වේවා''

## 4. ප්‍රයෝජ්‍ය ක්‍රියාව

කෙනෙකු ලවා කරවන ක්‍රියාව ප්‍රයෝජ්‍ය ක්‍රියාවයි.ක්‍රියා ධාතුවෙන් පරව ව ප්‍රත්‍යය යෙදීමෙන් ප්‍රයෝජ්‍ය ක්‍රියා ශබ්දය සෑදේ.

නිදසුන් - ''ඇත් ගොව්වනට සම්මත කරවා''
''දෙවියො සතුටු වැ මල් වැසි වස්වමින් සාධුකාර දෙන්නට වන්හ.''
''තිරිසනක්හු ලවා ඔවුන් මරවමි.''
''සතුන් ලවා සාධුකාර දෙවමින් ගුණ කියවමින් සතුටු කඳුළු බහවමින් වැඩි මඟෙහි වැලි පිටි පෙරළවමින්...''

## අසමාපක ක්‍රියා

### 1. පූර්ව ක්‍රියාව

පූර්ව ක්‍රියා යනු අවසාන ක්‍රියාවට පූර්වයෙන් සිදු වන ක්‍රියා ය. බුත්සරණෙහි පූර්ව ක්‍රියා ද්ව විධ වේ.

1. ප්‍රත්‍ය යෝගයෙන්
2. ක්‍රියාපදයට විශේෂිත රූප එක් වීමෙන්

i. පූර්ව ක්‍රියා ප්‍රත්‍යය.

ආ නසා, නඟා, නවතා, ගලා, බලා
ඇ ඇවිළැ, පැනැ, ඉක්මැ
ඊ කිපී, ගිලිහී

ii පූර්ව ක්‍රියා සඳහා විශේෂිත පද යෙදීම
''ඇස් දල්වාගෙනැ, දළ දත් දල්වාගෙනැ, මහ හඬින් හඬාගෙනැ ගෙනැ - දිවෙන භූතයින්ගෙ ගණන් නැත.''

ප්‍රයෝජ්‍ය පූර්ව ක්‍රියා - (ප්‍රයෝජ්‍ය ක්‍රියා+වා) ''කුම්මාසයක් පිලිගන්වා ලූ''
කොටැ - ''ප්‍රත්‍යවෙක්‍ෂා කොටැ වදාරා'' (බඹලොව පහරවා නස්සි)
''ධර්ම දෙශනා කොටැ වදාරා''
පියා - ''අඹ ඇටය මෙ තැන්හි මැ පස් පීරා පියා හිඳුවා ල''
ලා - ''ස්වාමි දරුවො තමන් වහන්සේ ගෙ පාත්‍ර චීවර උන් අතට දීලා''
වදාරා - ''දම්සක් පැවතුම් සූත්‍රය දෙසා වදාරා''



## 2. මිශ්‍ර ක්‍රියාව

මිශ්‍ර ක්‍රියා යනු අවසාන ක්‍රියා සමග ම සිදු වන ක්‍රියාව ය. වර්තමාන සිංහල භාෂාවේ මිශ්‍ර ක්‍රියා සෑදෙන ක්‍රම දෙකකි. ඒ පූර්ව ක්‍රියාව ද්විත්ව වීමෙන් සහ මින් ප්‍රත්‍යයයෝගයෙනි. මේ දෙ ආකාරයෙන් ම සැදුණ මිශ්‍ර ක්‍රියා බුත්සරණෙහි හමුවේ.

මින් ''මැණියෝ ද ළෙහි පහළ අතින් පිටැ හෙළු කෙහෙයෙන් වැනෙමින් හඬමින් පසුපස්සෙහි යෙත් ල''
පූර්ව ක්‍රියා - ද්විත්ව ''ළ කෙහෙල් ගොප් සොඬින් ගෙනැ සල සලා''
''මව හඬව හඬවා''

## 3. අසම්භාව්‍ය ක්‍රියාව

කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියාව සඳහා -ත් ප්‍රත්‍යය සහ අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියාව සඳහා - හොත් ප්‍රත්‍යයය බුත්සරණෙහි යෙදේ.

- ත් ''එක් සක්වළකට තල ඇටක් බැගින් හෙළා ගෙනැ යත් තල ඇට ගෙවී සක්වළ නොගෙවෙන්නාහු''
''සියළඟ සුණු විසුණු වැ යතුදු''
- හොත් ''ඔවුන් අවහොත් රට උපද්‍රවය සන්හිඳෙයි''
''අහසට දූමුව හොත් දොළොස් හවුරුද්දක් වැසි නැති ව යෙයි''

## 4. කෘදන්ත පද

පහත දැක්වෙන කෘදන්ත රූප බුත්සරණෙහි හමු වේ.

**1. වර්තමාන කෘදන්ත** - න, නු නා ප්‍රත්‍ය - සැටෙන, ගුමන
තප්නා, දන්නා
පොවනු, පුරනු

**2. අතීත කෘදන්ත** - කළ
මළ
දැමූ
කැපූ
ලත්
වන්
ගත්
ව

**3. පිණිසාර්ථ කෘදන්ත**

ප්‍රත්‍ය - කරනුවට, බලන්නට,

නිපාත - කරනු පිණිසැ, බලනු පිණිසැ

**4. ශක්‍යාර්ථ කෘදන්ත**

දැමියැ

එපියැ

ඉවසියැ

**5. ක්‍රියානාම**

| | | |
|---|---|---|
| නා | - | බලනා |
| නු | - | බලනු |
| උම් | - | කැවුම් |
| ඊම් | - | කිරීම් |
| මන් | - | කියමන් |
| ඊ | - | එන්නී |
| ඕ | - | කියන්නෝ |
| ආ | - | යන්නාවුන් |
| අන් | - | අසන්නන් |

## උපකාරක ක්‍රියා/ප්‍රච්ඡන්න ක්‍රියා/ක්‍රියා සමාස

**1. උපකාරක ක්‍රියා**

ක්‍රියා ධාතුවට අර්ථ විකාසනයක් එක් කළ මූලික ක්‍රියා පදයක් සමග එක් වූ උපකාරක ක්‍රියාවකින් සෑදී මූලික උපකාරක ක්‍රියා පද බුත්සරණෙහි සුලබ ව හමු වේ. මේවා අනුක්‍රියාපද/ උපකාරක ක්‍රියා වශයෙන් හඳුනාගැනේ.

මෙබඳු උපකාරක ක්‍රියා ධාතු 8ක් මෙහි දී හමු වේ.

1 ගනි
2 පා
3 පිය
4 ල
5 ය
6 ලබ/ලද
7 වඩි
8 මැනවි



මේවායේ විවිධ වරනැඟුම් රූප මූලික ක්‍රියා පද හා එක් ව බුත්සරණෙහි යෙදී ඇත.

උදා: එලී ගෙනැ
සිඳී ගෙනැ
මැරී ල
මරා පී
ඇනැ පිය
බහා ලන

**2. ප්‍රච්ඡන්න ක්‍රියා**

පූර්ව වරනැඟීම් නොදක්නා ලැබෙන ක්‍රියා රූප / ප්‍රච්ඡන්න ක්‍රියා (quasai verbs) හෙවත් ඌන ක්‍රියා බුත්සරණෙහි යෙදේ. මේවායේ වරනැඟීම් සීමා සහිත ය. ඇතැම් රූප ඓතිහාසික ව පූර්ව වරනැඟීම් සහිත රූපවලින් බිඳී ආ රූප වේ. බුත්සරණෙහි මෙබඳු රූප 5කි.

| | | |
|---|---|---|
| ඇති | - | කෑ හැකි |
| යෙදී නැති | - | |
| හැකි | - | කළ හැකි |
| යුතු | - | යා යුතු |
| කැමති | - | සනහනු කැමති |

**3. ක්‍රියා සමාස**

නාම ශබ්දයක් ක්‍රියා ධාතුවක් සමග එක් වූ රූප හෙවත් ක්‍රියා සමාස ද මධ්‍යකාලීන සිංහලයේ යෙදුණු බවට බුත්සරණ සාක්ෂ්‍ය දරයි.

උදා: රකවල්ලවා
ගල්ගැසුණු
රක්ෂා කර

මධ්‍යකාලීන සිංහල ක්‍රියා පදය සම්බන්ධයෙන් බුත්සරණ ග්‍රන්ථ අධ්‍යයනයෙන් අනාවරණිත තොරතුරු උක්ත පරිදි වේ.

**ආශ්‍රිත ග්‍රන්ථ:**

අභයසිංහ, ඒ. ඒ., සිංහල ගද්‍යය හා බුත්සරණ. **මහාචාර්ය ආනන්ද කුලසූරිය උපහාර ග්‍රන්ථය**, 1998, පි. 130 - 148.

අභයසිංහ, ඒ. ඒ., **සිංහල භාෂා විඥාන**. කැලණිය විශ්වවිද්‍යාලය, 1989, පි. 09- 57

අභයසිංහ, ඒ. ඒ. (සංස්.) **ව්‍යාඛ්‍යාන සහිත සිදත් සඟරාව**, කඩවත: අභය මුද්‍රණ ශිල්පියෝ සහ ප්‍රකාශකයෝ. 1998.

අමරවංශ හිමි, කොත්මලේ. (සංස්.) **සිංහල සාහිත්‍ය ලතා**, කොළඹ: එස්. ගොඩගේ සහ සමාගම. 1989.

කරුණාතිලක, ඩබ්. එස්. **ඓතිහාසික වාග්විද්‍යා ප්‍රවේශය**. කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම. 1989.

කරුණාතිලක, ඩබ්. එස්. **භාෂා සමීක්ෂා**. කොළඹ: එස්. ගොඩගේ සමාගම. 2006.

කරුණාතිලක, ඩබ්. එස්. **සිංහල භාෂා ව්‍යාකරණය**. කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම. 1995.

කුලසූරිය, ආනන්ද. **සිංහල සාහිත්‍ය I**. සමරගම: සමන් මුද්‍රණාලය, 1963.

ඤාණාලෝක නාහිමි, කෝදාගොඩ. **අමාවතුර**. කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1973.

දිසානායක, ජේ. බී. **භාෂාවක රටා සමුදාය**. කොළඹ: ලේක්හවුස් සමාගම, 1969.

ධම්මසේන හිමි, විල්පත. අමාවතුරෙහි ක්‍රියාපද පිළිබඳ පදිම විග්‍රහයක්. **ශාස්ත්‍රවේදී උපාධි නිබන්ධනය**, කැලණිය විශ්වවිද්‍යාලය, 1982.

මුනිදාස, කුමාරතුංග. **ක්‍රියා විවරණය** (තෙවන මුද්‍රණය), කොළඹ: කේ. ඒ. ආරියදාස සහ සමාගම. ක්‍රි. ව. 2527.

ලංකානන්ද ස්ථවිර, ලබුගම. (සංස්.), **බුත්සරණ**. කොළඹ: සී/ස ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, ද්විතීය මුද්‍රණය 1961.

සෝරතහිමි, වැලිවිටියේ. **ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය පළමු භාගය සහ ද්විතීය භාගය**. කොළඹ: ඇස් ගොඩගේ සහ සමාගම, 1998.

Geiger, Wilhelm., **A Grammar of the Sinhalese Language**. Colombo: The Royal Asiatic Society Ceylon branch, 1938.

Gleason, H. A., **An Introduction to Descriptive Liaguistics**. New York: 1955.

Godakumbura, C. E., **Notes on the Sinhala Verb**. Colombo: The Journal of the Royal Asiatic Society Ceylon branch, 1950.

Premarathne A. C., **The Verb in Early Sinhalese from the 3 C B C to the loc.AD.** University of London, Ph. D. Thesis, 1986.

# බෞද්ධ ප්‍රතිපත්ති පූරණයෙහි ලා පූජා චාරිත්‍රවල උපයෝගීතාව

**රන්ජනී මලවි පතිරණ**

Most of Buddhist rites and rituals are related to the popular Buddhism at present. Therefore this topic is very famous among Buddhists and they like to fulfill these rituals and organize lot of festivals for that. What pertains to a rite is generally taken as a ritual. Also a rite is defined as a formal procedure or act in a religious or other solemn observation. Festival or ceremony is described as the performance of some solemn act according to prescribed form. Some of the Theravāda rituals have been devised under the influence of Mahāyāna forms of worship today. However the objective of a Buddhist is to attain Nibbāna. Are Buddhist rituals caused to achieve that? This research paper reveals those facts related to early Buddhist attitude on rites and rituals.

## ප්‍රවේශය

බුදුසමය ව්‍යාප්ත වූ රාජ්‍යයන්හි සිදු වූ ප්‍රබල සංස්කෘතික විප්ලවය (Cultural Revolution) වූයේ සාම්ප්‍රදායිකව දක්නට ලැබුණු සිරිත් විරිත් හා ඇදහිලි ක්‍රම සඳහා එමගින් සිදු වූ සුවිශේෂ බලපෑම මත බෞද්ධ මූල සංස්කෘතියක් නිර්මාණය වීමයි. එතැන් සිට භාරතීය ශිෂ්ටාචාරයෙහි බලපෑම ද ප්‍රමුඛස්ථානයකට පත් වූ නිසා ම හින්දු සංස්කෘතියේ ආභාසය ලැබුණු බව පැහැදිලි ය. එම හින්දු සංස්කෘතිය හා බැඳුණු පූජා චාරිත්‍ර භාරතයේ අද ද දක්නට ලැබෙයි. ඒ අනුව බුදුදහම ප්‍රභවය වූ භාරතයේ ඊට මත්තෙන් පැවති පූජා විධීන් මෙන් ම බුදුසමයෙන් පුනර්ජීවනය ලැබූ පූජා විධීන් ද මෙම විපර්යාසයට මූලබීජ සැපයූ බව පැහැදිලි ය. බෞද්ධ දාර්ශනික චින්තාවන් ඔස්සේ

© **කථිකාචාර්ය රන්ජනී මලවි පතිරණ**

සංස්. මහාචාර්ය පැට්‍රික් රත්නායක, ආචාර්ය කේ. බී. ජයවර්ධන, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දිනලි ප්‍රනාන්දු

**මානවශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, 22 කලාපය, 2014/2015**

මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය